C
891.48109
ATT

# සිංහල පද්‍යයේ ආකෘතික විකාශනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ

ශාස්ත්‍රපති (පර්යේෂණ) උපාධිය

1986

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

එච්. එම්. අත්තනායක

406708

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY



## නිබන්ධන සංක්ෂිප්තය

සිංහල පද්‍ය ආකෘතිය ගී, සිව්පද හා සිලෝ යනුවෙන් ප්‍රධාන කොටස් තුනකට ද නිසඳැස් (නිදහස්) යනුවෙන් තවත් කොටසකට ද බෙදා ව්‍යවහාර කරනු දක්නට ලැබේ. මෙම ප්‍රභේදය වැදගත් වනුයේ එම හැඳින්වීමේ නාමයන් සිංහල පද්‍යයේ බාහිර ස්වරූපයක් හෙවත් ආකෘතියක් සිහි ගන්වන නිසාවෙනි. ප්‍රථමයෙන් ම ගීයත් ඉන් අනතුරුව සිව්පදයත් සිලෝවත් වශයෙන් නියත පැහැදිලි ස්වරූපයකින් සිංහල පද්‍ය බෙදා දැක්විය හැකි බවක් එහි මතුපිට අරුතින් කියැවේ. මෙම විමර්ශනයේ දී එම මතුපිට අරුත ඇතුළත දක්නට ඇති සංකීර්ණතාව විග්‍රහයට ලක් වනු ඇත.

ගීය මුල්කාලීන ජනතාවගේ පද්‍ය ආකෘතිය විය හැකි ය. සාමාන්‍ය ජනතාවට අයත් හඬ නගා ගායනා කළ හැකි දේශීය ජන ගායනා සම්ප්‍රදායක් පෙර පැවැතියා විය හැකි ය. අක්ෂර දැන උගත් පරපුරක ආරම්භයත් සමඟ ප්‍රථම පද්‍ය ආකෘතිය එම ජන ගී ආකෘතියෙන් ම සැදුණා විය හැකි ය. එසේ නැතහොත් ආචාර්යයන්ගේ ආගමනයත් සමග පද්‍යයේ ආකෘතිය ද ඔවුන් ගෙන ආවා විය යුතු ය. ඒ කෙසේ වෙතත් ප්‍රථම පද්‍ය ආකෘතිය පොදු ජන රුචිය හා සමානව ගිය, ඊට පිටු නො පෑ, එරෙහි නොවූ පද්‍ය ආකෘතියක් බව පෙනෙන්නට තිබේ.

දේශීය ජන ගායනාවලට සමගාමී ව ගමන් කළ සිංහල පද්‍ය එහි සියලු පරිණාම ලක්ෂණයන් ග්‍රහණය කර ගනිමින් සිගිරි ගී පබැඳෙන 6, 7, 8, 9, 10 සියවස් තෙක් ගමන් කරනු දක්නට ලැබේ. ඒ නිසා ම සිගිරි පද්‍ය තුළ එළිසම, එළිසම ගී විරිත් ද දක්නට ලැබේ.

දහවන ශත වර්ෂයෙන් පසු සිංහල පද්‍යයේ සිදුවන වැදගත් ම සිදුවීම වනුයේ <u>සියබස්ලකර</u> නම්, සකු කාව්‍ය විචාර ග්‍රන්ථ ඇසුරු කොට ගත් පද්‍ය විචාර ග්‍රන්ථයකට

සිංහල පද්‍යයේ ස්වරූපය වෙනස් කිරීමට හැකියාව ලැබීම යි. ගීය ව්‍යක්ත ලක්ෂණවලින් සරසමින් උගතුන්ට වඩාත් ගෝචර වන සම්ප්‍රදායක් සිංහලයෙහි පැතිර යාම කව්සිළුමිණි මුවදෙව්දා සසදා ගී කාව්‍යයන්ගෙන් පෙන්නුම් කෙරේ. ඒ අතර ම ගී කාව්‍ය පහළ වූ, යුගයේ ගී කාව්‍ය හෝ සියබස්ලකර හෝ නොතැකූ දේශීය පද්‍ය සම්ප්‍රදායක් ද ගී කාව්‍යයන්ට පරිබාහිර ව පැවැති බව එළුසඳැස් ලකුණින් හෙළි වේ, බුත්සරණ ඈ ගද්‍ය කාව්‍යයෝ ද ඊට සාක්ෂි දරති. ගී යුගය අවසන් වන් ම ගම්පළ - කෝට්ටේ යුගයේ ව්‍යක්ත සම්භාව්‍ය කවියන් එළිසමයට ප්‍රවේශ වීම ක්ෂණික ක්‍රියාවක් සේ මේ අනුව සිතිය නොහැකි ය. එමෙන් ම ගම්පල-කෝට්ටේ සමයේ පැතිර යන එළිසමයත්, ඊට පෙර යුගයේ ගී කාව්‍ය ආකෘතියත් අතර දැකිය හැකි සම්බන්ධයක් ද නැත. සීගිරි ගී ආකෘතිත් ගම්පළ-කෝට්ටේ සමයේ සිව්පද ආකෘතිත් අතර පරිණාමීය සම්බන්ධයක් දැකීම පහසු විය හැකි ය. කාලය වශයෙන් ඊට වඩා ළං වන ගී යුගය (10-13 සියවස්) හා සිව්පද යුගය (14-15 සියවස්) එලෙස සම්බන්ධ කොට දැක්වීම පහසු නො වේ. ඒ අනුව පෙනෙනුයේ ප්‍රථමයෙන් ගීය ස්වකීය පද්‍ය ආකෘතිය ලෙස තෝරා ගැනීමේ දී ද ව්‍යක්ත සම්භාව්‍ය පද්‍ය රචකයන් දේශීය ජන කවි හෝ ජන ගායනාවලට සිත් යොමු කළ නියරින් ම ගම්පල-කෝට්ටේ සමයේ සම්භාව්‍ය පද්‍ය රචකයක් ද ගැමි කාව්‍ය ආකෘති දෙසට නැමී ගිය බවකි. මේ වන විට ගී ආකෘතිය සම්භාව්‍ය ගී කාව්‍ය කරුවන් ඒකාකාරී ව වැහැරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යල් පැන ගිය බව පෙනෙන විට යළිත් වරක් පද්‍යයට උචිත ආකෘතියක් සෙවීමේ ගැටලුවට සම්භාව්‍ය රචකයින් පැමිණ ඇත. මේ අනුව ගතහොත් කෝට්ටේ අවදියේ සම්භාව්‍ය කවීන් අවම තරමින් එළිසම සිව්පදය හෝ එහි ශ්‍රැති ගෝචරත්වය හෝ ගැමි කවීන්ගෙන් ඉගෙන ගෙන ඇත. ගීයේ ම ක්‍රම විකාශයක් සේ එළිසම සිව්පදය නිර්වචනය කළ හැකි වුව ද ලංකාවේ පද්‍ය ආකෘති විකාශනයේ දී එය කෙතෙක් සහේතුක දැයි විමසිය යුතු ය.

ගම්පළ-කෝට්ටේ අවදියේ සිට සීතාවක, මහනුවර අවදි දක්වාත් ඉන් පසුවත් එළිසම සිව්පදය විවිධ මුහුණුවරින් භාවිත වනු දක්නට ලැබේ. මෑතර අවදිය තෙක් සම්භාව්‍ය කවීන් පොදු ජනතාවගේ පද්‍ය ආකෘති සොයා යාමේ ප්‍රවණතාව [illegible] එම

අවදියේ දී ප්‍රථම වරට වෙනස් වනු දක්නට ලැබේ. කෝට්ටේ යුගයේ සිට වැහැරුණු සිව්පදය වෙනුවට පද්‍ය බන්ධනය සඳහා උචිත පද්‍ය ආකෘතියක් සඳහා බුද්ධිමතුන් පෙරට ඒමක් ලෙස ද මෙම ප්‍රවණතාව හැඳින්විය හැකි ය. සිලෝ ආකෘතිය එම ව්‍යායාමයේ ප්‍රථම පියවර සේ දැක්විය හැකි ය. එහෙත් පද්‍යයේ ශ්‍රව්‍ය ගෝචරත්වය මැඩ සිලෝ ආකෘතියට සිංහල පද්‍ය ක්ෂේත්‍රය තුළ තහවුරු වීමට හැකි නො වේ. සිලෝව සාමාන්‍ය ජනතාව ව්‍යවහාර කරන ශ්‍රව්‍ය ගෝචර ලක්ෂණවලින් පිරිපුන් ව ජනකවි ආකෘතිය සිහි ගන්වන රටාවලින් වර්ධනය වේ.

සිංහල පද්‍යයට උචිත පද්‍ය ආකෘතියක් පිළිබඳ ව යළිත් සම්භාව්‍ය උගතුන්ගේ අවධානය යොමු වනුයේ වර්තමාන බුද්ධි ප්‍රබෝධයේ මූලාරම්භක සමයත් සමග ය. මුනිදාස කුමාරතුංග ගේ හෙළ හවුල් ව්‍යාපාරයෙන් යළි හඳුන්වා දීමට තැත් කළ පැරණි ගී ආකෘති භාවිතය එහි පළමුවැන්න ය. ප්‍රංශ සංකේතවාදීන්ගේ සහ වෙනත් විවිධ බටහිර පද්‍ය රචකයන්ගේ ආභාසයෙන් ජී.බී.සේනානායක, මාර්ටින් වික්‍රමසිංහ, සිරි ගුනසිංහ, භාවිත කළ නිදහස් පද්‍ය ආකෘතිය එහි දෙවැන්න ය. හෙළ හවුල යළි පුනර්ජීවනය කිරීමට තැත් කළ පැරණි ගී ආකෘතිය පිළිබඳ අත්හදාබැලීම ඉක්මනින් ම යටපත් වී ගිය අතර නිදහස් පද්‍ය ආකෘතිය පිළිබඳ අත්හදාබැලීම වර්තමානය තුළ පවා විවිධ මුහුණුවරින් ක්‍රියාත්මක වෙමින් පවතී. නිදහස් පද්‍ය ආකෘතිය ශ්‍රව්‍ය ගෝචරත්වයට පිටු පා ආරම්භ වුව ද එය යළිත් ශබ්ද මාධුර්යය සොයා යමින් සිටින සැටි 1985 පමණ වන විට පළ වී ඇති පද්‍ය කෘතීන්ගෙන් පෙනෙන්නට තිබේ.

සිංහල පද්‍යයේ ආකෘතිය යනු ගිය, එළිසම, සිලෝව, නිදහස් ආකෘති පමණක් සේ නොසලකන මෙම නිබන්ධනය එය විවිධ මුහුණුවරින් විග්‍රහ කරනු ඇත. පද්‍යය භාෂාත්මක ප්‍රකාශනයක් වන හෙයින් පද්‍යයේ භාෂාව එහි ප්‍රධාන ආකෘතික ලක්ෂණය සේ සලකන මෙම නිබන්ධනය ඡන්දස් අලංකාර, දුෂ්කර බන්ධන වැනි පද්‍යයේ ස්වරූපය තීරණය කරන ආකෘති අංගවල පරිණාමය ද විමසුමට යොමු කර ගනු ඇත.